# ලයනල් ගුරුගේ එ. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 975 /2019 (2019.04.30 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - ලයනල් ගුරුගේ
**නොතිසි ලත් පාර්ශවය** - නම් කළ නිලධාරී, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

**පෙනීසිටීම**
අභියාචක - පෙනී නොසිටින ලදි
පොදු අධිකාරිය - කුමාර විජේරත්නායක, නියෝජ්‍ය සාමාන්‍ය කළමණාකාර

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.10.08 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | - |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.11.01 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | - |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.12.13 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2018.10.08 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත දැක්වෙන තොරතුරු ඉල්ලා සිටින ලදි.

1) ***පෞද්ගලික බස් රථ ධාවනයට අදාළ නීති රීති සහ කොන්දේසී කවරේද?***
2) ***පෞද්ගලික බස් රථ රාත්‍රී ධාවනය නොකරන්නේ මන්ද?***

තොරතුරු නිලධාරියා පනතේ සඳහන් කාල පරාසය තුළ කටයුතු කිරීමට අපොහොසත් වීම මත අභියාචක විසින් 2018.11.01 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරියාද නියමිත කාල සීමාව තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීම මත අභියාචක විසින් 2018.12.13 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචක අභියාචනා විභාගයට පැමිණ නොමැති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටී.

පොදු අධිකාරිය විසින් 2019.04.11 දිනැතිව කොමිෂන් සභාවට එවා ඇති ලිපිය කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමුවිය. එහි සඳහන් වන්නේ, අභියාචක ලයනල් ගුරුගේ විසින් ඉල්ලා ඇති තොරතුරු අදාළ ඇමුණුම් සමඟ 2019.01.16 දිනැතිව ලියාපදිංචි තැපෑලෙන් ඔහු වෙත යොමුකර ඇති බවත් එය සනාථ කිරීම සඳහා ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලියාපදිංචි තැපැල් කුවිතාන්සියේ ඡායා පිටපතක් මේ සමඟ යොමුකරන බවත්ය.

එසේම පොදු අධිකාරිය නියෝජනය කරමින් පැමිණ සිටි නිළධාරියාද කරුණු දක්වා සිටියේ අදාළ ලිපිය ප්‍රකාරව මේ වන විටත් අභියාචක වෙත අදාළ තොරතුරු ලබා දී ඇති බවය.

මේ අනුව කොමිෂන් සභාවද නිරීක්ෂණය කරන්නේ අදාළ පොදු අධිකාරිය විසින් 2019.01.16 දින අදාළ තොරතුරු අභියාචක වෙත ලියාපදිංචි තැපෑල මඟින් යොමුකර ඇති බවයි.

**නියෝගය:**

මෙම කරුණු නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව නියෝග කර සිටිනුයේ අභියාචක විසින් අයදුම්කර ඇති තොරතුරු පොදු අධිකාරිය විසින් ලබා දී ඇති බවත් ලබාදුන් තොරතුරු සම්බන්ධව අභියාචක සෑහීමකට පත් නොවන්නේ නම් ඒ පිළිබඳව මෙම නියෝගය ලැබී සති දෙකක කාලයක් ඇතුළත කොමිෂන් සභාවට දැනුම් දෙන ලෙසයි.

මීට යටත්ව අභියාචනය අවසන් කරනු ලැබේ.

********

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.